# බහුසංස්කෘතික ලක්ෂණ විදහාපාන නාලන්දා ගේඩිගේ

කේ.ජී.එම්.එස්.කේ.ජයරත්න

පුරාවිද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
manori.pera.92@gmail.com

---

නාලන්දා ගෙඩිගේ මාතලේ-දඹුල්ල මාර්ගයේ වගහපතන උඩිසියපත්තුවේ හුදෙකලාව පිහිටා ඇත. මෙය ශ්‍රී ලංකාවේ මධ්‍ය ප්‍රදේශයක පිහිටා තිබෙන බැවින් අතීතයේ පටන්ම යම් කිසි තීරණාත්මක ස්ථානයක් බවට පත්වන්නට ඇත. ඒ බව මෙම ප්‍රදේශය අවට පිහිටි පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර දෙස බැලීමෙදී පැහැදිලි වේ. බෝවතැන්න ජලාශය ඉදිකිරීම නිසා මෙය පිහිටි ස්ථානයෙන් උස්ව පුරාවිද්‍යා දේපාර්තමේන්තුව මඟින් නැවත ස්ථාපිත කර ඇත.

එක් ශෛලියකට පමණක් සීමා නොවී විවිධ ශෛලීන් ඔස්සේ පාෂාණ පමණක් උපයෝගී කර ගනිමින්  මෙය නිර්මාණය කර තිබේ. නාලන්දාව සතරැස් මාලකයකින් වටවී ඇති අතර ප්‍රවිශ්ට වීමට පිය ගැට පෙළක් සහිත වාහල්කඩක් පවතී. ප්‍රමාණයෙන් කුඩා වූ ද්වාර මණ්ඩපය, මණ්ඩපය හා ගර්භ ගෘහය ලෙස කොටස් තුනකින් යුක්ත වේ. මෙහි බිම් සැලැස්ම හින්දු ශෛලිය ගත්තකි. ද්වාර මණ්ඩපයට පිවිසෙන ස්ථානය කැටයම් රහිත සඳකඩපහණකින් සහ මකර හිස සහ ලියවැලින් යුක්ත කොරවක් ගලකි. ද්වාර මණ්ඩපයෙන් මණ්ඩපයට පිවිසෙන ස්ථානයෙන් ඉහළ ගජලක්ෂ්මී රූප දෙකකි. මණ්ඩපයේ කුළුණුවල ඉහළ මල් සහිත චෛත්‍ය කවාට දැක ගත හැකිය. මණ්ඩපයෙන් ගර්භ ගෘහයට පිවිසෙන ස්ථානයේ අංජලී බුද්ධ රූප දෙකක් හා ප්‍රාසාද රූප පහකින් යුක්තය. ගර්භ ගෘහය ඇතුළත බුද්ධ ප්‍රතිමාව, අවලෝකීතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමාව සහිත ගල්පුවරුව මෙන්ම ගනේෂ දේව ප්‍රතිමාවක් ද වේ.

පිටත බිත්ති ව්‍යාප්තිය ස්ථම්භ මඟින් මහල් තුනක් දිස්වෙන සේ නිර්මාණය කර ඇත. මෙහි පිටතින් සමස්ත නිර්මාණ වටා මල් පොහොට්ටු, අධෝපුෂ්ප හා සුපෝෂ්පිත පුෂ්ප දක්නට ලැබෙන කවාට කැටයම් වේ. මෙහි වැදගත්ම සැරසිල්ල වනුයේ කුවේරයාගේ කුඩු සැරසිල්ලයි. එහි මධ්‍යයේ මකර රූප සහ මල් පොහොට්ටුවලින්  අලංකාර වේ. එසේම මෙහි එක් ස්ථානයක පිරිමින් දෙදෙනෙක් හා කාන්තාවන් එක්ව  සිටින ආකාරය වැදගත් සැරසිල්ලකි. සඳකඩ පහණ, ද්වාර මණ්ඩපයෙන් මණ්ඩපයට පිවිසෙන ස්ථානයේ ඉහළ ඇති ගජලක්ෂ්මී රූපය ද, ගර්භ ගෘහයට පිවිසෙන ස්ථානයේ ඉහළ ඇති බුද්ධ රූපය බෞද්ධ ආගමික සංකල්පය ද, කොරවක් ගල, මකර රූව සහ යන්ත්‍ර ගල මහායාන ධර්මයෙහි බලපෑම ද පෙන්වන්නකි. මෙවන් සාධක හරහා මධ්‍ය ප්‍රදේශයක ස්ථාන ගතවීමත්, වෙළෙඳ නගර අවට ප්‍රදේශවල තිබීමත් අසලින් ගමන් කරන මාර්ගයත් නිසා නාලන්දාව බහුආගමික, බහුසංස්කෘතික පිරිස්වල අනුග්‍රහක ලක්ෂණ ඇති අතර එහෙයින් මෙය බහු සංස්කෘතික නිර්මාණයක් වූ බව උපකල්පනය කළ හැකිය.

ප්‍රමුඛ පද :  නාලන්දා ගෙඩිගේ, බහු සංස්කෘතික, හින්දු ශෛලිය